# වාර්ෂික වාර්තාව - 2016



## උද්භිද උද්‍යාන භාර අරමුදල

## ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

## පේරාදෙණිය

## ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම සහ සුභ සාධනය සඳහා වු භාර අරමුදල

## වාර්ෂික වාර්තාව - 2016 වර්ෂය

ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන වැඩි දියුණු කිරීම හා සුභ සාධනය සඳහා භාර අරමුදලක් මැයෙන් 1995.12.15 වැනි දින එවකට කෘෂිකර්ම ඉඩම් හා වන සම්පත් ඇමතිවරයා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සලකා බලා 1996 - 02 - 07 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම සහ සුභ සාධනය සඳහා භාර අරමුදල පිහිටුවීම සඳහා අනුමැතිය ලබාදී ඇත.

උද්භිද උද්‍යාන සඳහා වන ප්‍රවේශ පත්‍ර විකිණීමෙන් ලැබෙන ආදායමින් වාර්ෂිකව 25% ක් උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම හා සුභ සාධනය සඳහා වු භාර අරමුදලට ආදායම වශයෙන් නාමිකව බැර කරනු ලැබේ. මේ සඳහා සෑම වර්ෂයකම භාණ්ඩාගාර අනුමත ඇස්තමේන්තුවේ 2201 වැය විෂය (ප්‍රාග්ධන මාරු) යටතේ ප්‍රතිපාදන වෙන්කර දී ඇත. අරමුදලේ වියදම් දැරීමට අවශ්‍ය මුදල්, අවශ්‍යතාවය අනුව දෙපාර්තමේන්තුවේ අග්‍රිම මුදලින් ලබාගෙන වර්ෂය අවසානයේ පියවීම් කරනු ලැබේ. ඊට අමතරව අරමුදලේ ආදායම වැඩිකර ගැනිම සඳහා සුදුසු කාර්යයන් ඉටු කර ගැනිමට ද ඉඩකඩ සලසා ඇත.

මෙම අරමුදල භාරකාර මණ්ඩලයකින් පාලනය වන අතර, එම භාරකාර මණ්ඩලයේ සභාපති වශයෙන් රේඛීය අමාත්‍යාංශයේ ලේකම් ද , භාරකාර මණ්ඩලයේ ලේකම් වශයෙන් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ද, භාරකාර මණ්ඩලයේ සාමාජික වශයෙන් මහා භාණ්ඩාගාරයේ අය - වැය අධ්‍යක්ෂ ද කටයුතු කරනු ලැබේ.

### උද්භිද උද්‍යාන භාර අරමුදල

1. **අරමුදලේ නම : ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම සහ සුභ සාධනය සඳහා භාර අරමුදල**
2. **ස්වභාවය : උද්භිද උද්‍යාන සංවර්ධන කටයුතු, සුභ සාධන කටයුතු සහ අවශ්‍ය අවස්ථාවන්හි පුනරාවර්තන කටයුතුවලට මුල්‍ය සහාය ලබාදීම**
3. **අදාල චක්‍රලේඛයන් :**
   - **I අරමුදල ආරම්භ කිරීම - 1917 අංක 09 දරණ අරමුදල් ආඥා පනත අනුව**
   - **II ගිණුම් තැබිම හා ගිණුම් වාර්තා කිරීම භාණ්ඩාගාර චක්‍රලේඛ 1977 අගෝස්තු 16 දිනැති අංක 836 දරණ චක්‍රලේඛය හා 2006.12.22 දින නිකුත් කල රාජ්‍ය මුදල් චක්‍රලේඛ PF/423 අනුව**
4. **ආරම්භ කළ දිනය : 1996 දෙසැම්බර් 20**
5. **කාර්යාලය : පේරාදෙණිය ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය**
6. **බැංකුව : පේරාදෙණිය ලංකා බැංකුව : ගිණුම් අංක 0007040848**

7. අරමුදලේ පරමාර්ථ:

- ✓ ශ්‍රී ලංකාවේ හා විදේශ රටවල් තුල උද්භිද උද්‍යාන පිළිබඳව පවතින ප්‍රතිරූපය තවදුරටත් යහපත් කිරීමේ ක්‍රියා මාර්ග ගැනිම.
- ✓ පාරිසරික අධ්‍යාපනික හා ශාක පිළිබඳව දැනට පවත්නා සංරක්ෂණය සම්බන්ධයෙන් අර්ථාන්විත වැඩසටහන් ක්‍රියාත්මක කොට දියත් කිරීම.
- ✓ උද්භිද උද්‍යානයන්හි සේවා නියුක්ත විද්‍යාඥයින්ගේ විද්‍යාත්මක දැනුම, ක්‍රියාකාරකම් හා පහසුකම් වැඩි දියුණු කිරිම මෙන්ම අදාල කටයුතු සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනිමට මුල්‍යමය ආධාර සැපයිම.
- ✓ ශාක එකතුව පිළිබඳව ද වර්ධනාත්මක වැඩ පිළිවෙලක් ඇති කිරීම.
- ✓ උද්භිද උද්‍යානයන්හි ප්‍රයෝජනය සඳහා පාරිසරික අධ්‍යාපනික සංරක්ෂණ හා වැඩි දියුණු කිරීමේ කටයුතු සම්බන්ධයෙන් තාක්ෂණික ක්ෂේත්‍රයන්හි ක්‍රියාකාරකම් වර්ධනය කිරීම හා ඊට ආධාර කිරීම.
- ✓ විද්‍යාඥයින්ට හා උද්භිද උද්‍යානයට පැමිණෙන අයට අවශ්‍ය පහසුකම් සැපයිම සඳහා අවශ්‍ය ඕනෑම හදිසි ඉදිකිරීමේ කටයුත්තක් භාර ගැනිම.
- ✓ අවශ්‍ය අවස්ථාවන්හිදී පුනරාවර්තන ප්‍රතිපාදන වල ඌණතාවයන් ඌණපුරණය කිරීම.


<u>2016 වර්ෂයේ අරමුදලේ මුදල් ප්‍රගතිය</u>

| | | | |
|---|---|---|---|
| 2016-01-01 දිනට බැර ශේෂය | = | රු. | 145,397,654.65 |
| **<u>එකතු කළා:</u>** | | | |
| 2016 වර්ෂයේ ආදායම (බැර කිරීම්) | = | රු. | 148,540,186.28 |
| | | | -------------------- |
| එකතුව | | රු. | 293,937,840.93 |
| **<u>අඩු කළා :</u>** | | | |
| 2016 වර්ෂයේ වියදම් (හර කිරීම්) | = | රු. | 139,957,695.60 |
| | | | -------------------- |
| 2016.12.31 දිනට භාණ්ඩාගාර ශේෂය | = | **රු.** | **<u>153,980,145.33</u>** |

* (මෙම ශේෂය නාමික ශේෂයක් පමණි)

**අරමුදලේ ප්‍රධාන පරමාර්ථයක් වන ශ්‍රී ලංකාව තුල හා විදේශ රටවල් තුල ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන පිළිබඳව පවතින ප්‍රතිරූපය තව දුරටත් ඉහල නැංවීම අරමුණු කරගෙන පහත සඳහන් කටයුතු අරමුදලේ ප්‍රතිපාදන යොදා ගනිමින් 2016 වර්ෂයේදී ඉටු කරන ලදී.**

- උද්භිද විද්‍යා පර්යේෂණ යටතේ දේශීය ශාක සංරක්ෂණය හා ශාක පිළිබඳ දත්ත එකතු කිරීම සඳහා ජාතික ශාකාගාරය විසින් ක්‍රමවත් වැඩ පිළිවලක් අරඹන ලදි. ඒ අනුව අරමුදලේ ප්‍රතිපාදන යොදා ගනිමින් මීට පෙර මුද්‍රණය කළ “ Beautiful Wild Flowers Of Sri Lanka ” පොත නවතම තොරතුරු ඇතුලත් කර 2016 වර්ෂයයේදී දෙවන මුද්‍රණය නිකුත් කරන ලදි. මෙම පොත උද්භිද උද්‍යාන වල අලෙවිසැල් වල රු.850/= බැගින් අලෙවි කරනු ලබන අතර,එහි ආදායම අරමුදලේ ආදායමක් ලෙස ගිණුම් ගත කෙරේ.



“Wild Flowers of Sri Lanka” ග්‍රන්ථය

- උද්භිද උද්‍යාන වල සේවයේ නියුතු විද්‍යාඥයින්ගේ තාක්ෂණ දැනුම අවබෝධය වර්ධනය කිරීම සඳහා මෙම වසරේ ජාතික ශාකාගාරය භාර ප්‍රධාන නිලධාරිනිය එක්සත් රාජධානියේ “ කිව් උද්භිද උද්‍යානයේ ” පැවති “ PLANT TAXONOMY IDENTIFICATION AND DUTIES OF THE NATIONAL HERBARIUM ” පුහුණුවට සහභාගි කරවන ලදි.

- උද්භිද උද්‍යානය නැරඹීමට පැමිණෙන නරඹන්නන්ගේ උද්භිද විද්‍යාත්මක අවබෝධය ඇතිකරලීම සඳහා ජාතික ශාකාගාරය මගින් පහත සඳහන් පෝස්ටර් දෙක මුද්‍රණය කර එකක් රු 100/- බැගින් අලෙවි කිරීම සඳහා උද්භිද උද්‍යාන වල අලෙවිසැල්වලට නිකුත් කර ඇත.

  මෙම ආදායම උද්භිද උද්‍යාන භාර අරමුදලේ අතිරේක ආදායමක් ලෙස අරමුදලට බැර කරනු ලැබේ.







1. " ENDEMIC FLOWERING PLANTS OF SRI LANKA "

2. " BEAUTIFUL ORCHIDS OF SRI LANKA"

- මීට අමතරව මල් වගා පර්යේෂණ අංශය විසින් මල්වගා ගොවීන්ගේ දැනුම අවබෝධය සඳහා මල් වගාව පිළිබඳව පහත සඳහන් උපදෙස් පොත් මෙම වර්ෂයේ මුද්‍රණය කර අලෙවිය සඳහා උද්භිද උද්‍යාන අලෙවිසැල් වෙත නිකුත් කර ඇත. මෙම ආදායමද උද්භිද උද්‍යාන භාර අරමුදලේ අතිරේක ආදායමක් ලෙස අරමුදලට ගිණුම් ගත කෙරේ.

1. ඩ්‍රැසීනා සැන්ඩ්‍රියානා මල් වගා උපදෙස් පොත

2. උඩවැඩියා මල් වගා උපදෙස් පොත

- උද්භිද උද්‍යාන අලංකාරව පවත්වාගෙන යාම නිසාත්, උද්භිද උද්‍යාන වනජීවීන්ට හිතකර පරිසර තත්වයක ඇති නිසාත් මෑත කාලයේ සිට උද්භිද උද්‍යාන වල වනජීවී සතුන් පිළිබඳවද අවධානය යොමු කර ඇත. ඒ පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීමද සිදු කරමින් පවතී. ඒ යටතේ සංචාරකයින්ගේ සිත් ඇදගන්නා සමනලුන් පිළිබඳව " The Butterfly Fauna Of Sri Lanka" පොත් 05 ක් මිලදී ගෙන උද්භිද උද්‍යානවල පුස්තකාල වල ප්‍රයෝජනය සඳහා නිකුත් කර ඇත.

- ජාතික උද්භිද උද්‍යාන වන සතුන් හා වෘක්ෂ ලතා පිළිබඳව මහජනයා දැනුවත් කිරීමේ අරමුණින් තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය දිනමිණ පුවත් පතේ " වන දිවිය " නමින් පුවත්පත් අතිරේකයක් මාසිකව පල කරන අතර, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ උද්භිද උද්‍යාන භාර අරමුදල මගින් ඒ සඳහා වන වියදමින් කොටසකට දායකත්වය පසුගිය වසරේ සිට ලබා දීම කරනු ලැබේ.

- නිලධාරීන්ගේ සහ සේවකයන්ගේ දැනුම, කුසලතා, ආකල්ප වර්ධනය කිරීම පිණිස පුහුණු වැඩසටහන් අවශ්‍ය වන අතර, එවැනි දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් සඳහා උද්භිද උද්‍යාන භාර අරමුදල මගින් ප්‍රතිපාදන සලසන ලදි.

**<u>ප්‍රතිපාදන වෙන් කල පුහුණු වැඩ මුළු</u>**

- ඵලදායී අභ්‍යන්තර විගණනය පිළිබඳ දෙදින පුහුණු වැඩමුළුව
- එංගලන්තයේ " කිව් උද්‍යානයේ " පැවති පුහුණු වැඩමුළුව
- කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ පැවති " Plant Breeding Techniques for the important of Annual Food & Floriculture crops " වැඩමුළුව

# 2016 වර්ෂයේ අරමුදලේ ප්‍රතිපාදනය යොදා ගනිමින් ඉටු කරන ලද විශේෂිත සංවර්ධන කාර්යයන්

## පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය

- නරඹන්නන් හට පහසුවෙන් හා ආරක්ෂාකාරීව උද්‍යානය තුළ නැරඹීම් කටයුතු සිදු කිරීම සඳහා අභ්‍යන්තර මාර්ග පද්ධතිය නවීකරණය කළ අතර, මේ සඳහා උද්භිද උද්‍යාන භාර අරමුදල මගින් රුපියල් මිලියන 13.3 ක ප්‍රතිපාදන යොදන ලදි.



මාර්ග කාපට් අතුරා තත්ත්වය වැඩිදියුණු කර ඇති අයුරු

- නරඹන්නන් හට ගිමන් හැරීම සඳහා මෙම වසරේදී අලුතින් ගිම්හාන කුටි 03 ක් රාජකීය උද්භිද උද්‍යානයේ ඉදිකල අතර, ඒ සඳහා රුපියල් මිලියන 3.8 ක ප්‍රතිපාදන වෙන් කෙරිණි.



ඉදි කෙරුණු ගිම්හාන කුටියක්

- නරඹන්නන්ට පහසුකම් සැලසීම යටතේ පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ කැෆටේරියා ආපන ශාලාවද 2016 වසරේ නවීකරණය කළ අතර, ඒ සඳහා ද උද්‍යාන භාර අරමුදල මගින් ප්‍රතිපාදන සලසා ඇත. මේ සඳහා රුපියල් මිලියන 2.5 ක් පමණ වැය වී ඇත.

- රුපියල් මිලියන 3 ක වියදමක් දරමින් 2016 වසරේ පේරාදෙණිය උද්භිද උද්‍යානයේ ප්‍රධාන ගේට්ටුව හා අවට සී.සී.ටී.වී කැමරා පද්ධතියක් සවි කෙරුණු අතර, එමගින් කාර්යක්ෂම සේවාවක් ලබා ගැනීමට කටයුතු කර ඇත.

- දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන නිලධාරීන්ට පහසුකම් සැලසීම යටතේ නව නිල නිවාස ඉදිකිරීම සහ නවීකරණ කටයුතු සිදු කිරීම සඳහාද උද්භිද උද්‍යාන භාර අරමුදල මගින් ප්‍රතිපාදන සලසා ඇත. මේ සඳහා රුපියල් මිලියන 07 ක් පමණ මෙම වසර තුළදී වැය වී ඇත.



**අලුතින් ඉදිවන නිල නිවස**

- නරඹන්නන්ට පහසුවෙන් උද්‍යානය නැරඹීමට ඉඩ සලසා දෙමින් මාර්ගෝපදේශ පත්‍රිකා මුද්‍රණය කළ අතර, ඒ සඳහා උද්භිද උද්‍යාන භාර අරමුදල දැරූ වියදම රුපියල් මිලියන 1.4 කි.

මෙම පත්‍රිකා සිංහල , දෙමළ, ඉංග්‍රීසි භාෂා වලින් මුද්‍රණය කරන අතර, එක් පත්‍රිකාවක් රු. 20/= බැගින් අලෙවි කරනු ලබන අතර, විදේශීය නරඹන්නන්ට ප්‍රවේශ පත් මිලදී ගන්නා අවස්ථාවේදීම ඉංග්‍රීසි මාර්ගෝපදේශ පත්‍රිකාවක් නොමිලේ ලබා දෙනු ලැබේ.

අලෙවිකරනු ලබන මාර්ගෝපදේශ පත්‍රිකා වල ආදායම අරමුදලේ අතිරේක ආදායමක් ලෙස ගිණුම් ගත කෙරේ.

- මීට අමතරව
  - රුපියල් මිලියන 05 ක් පමණ වැය කර උද්භිද උද්‍යාන නඩත්තුව සඳහා අවශ්‍ය උපකරණ මිළ දී ගැනීම

    සහ

  - ක්ෂේත්‍රයේ රාජකාරී කටයුතු වල සේවයේ යෙදී ඇති සේවකයන් සහ නරඹන්නන් පහසුවෙන් හඳුනා ගැනීම සඳහා සේවකයන් හට ලක්ෂ 03 ක් පමණ වැය කර නිල ඇඳුම් සැපයීම සඳහා ප්‍රතිපාදන සලසන ලදි.

## හක්ගල උද්භිද උද්‍යානය

- හක්ගල උද්භිද උද්‍යානයේ දැනට පවතින කාර්යාල ගොඩනැගිල්ලේ ඉඩකඩ ඉතා සීමිත බැවින් එය පුළුල් කර වැඩිදියුණු කිරීමට කටයුතු යොදන ලදි. මේ සඳහා 2016 වසරේ උද්භිද උද්‍යාන භාර අරමුදල මගින් රුපියල් මිලියන 3.1 ක ප්‍රතිපාදන වෙන් කරන ලදි.



පුළුල් කර වැඩි දියුණු කර ඇති කාර්යාල ගොඩනැගිල්ල

- හක්ගල උද්භිද උද්‍යානයේ නව පිවිසුමේ සංවර්ධන කාර්යයන් මේ වසරේද සිදු වූ අතර, ඒ සඳහා රුපියල් මිලියන 12.4 ක ප්‍රතිපාදන වෙන් කෙරුණි.



වැඩ අවසන් කල නව පිවිසුමේ ප්‍රවේශ පත්‍ර කාර්යාලය

- හක්ගල උද්භිද උද්‍යානය දුෂ්කර ප්‍රදේශයක පිහිටා ඇති බැවින් නිලධාරීන්ට නිල නිවාස ලබා දීම උද්භිද උද්‍යාන කටයුතු සඳහා පහසුවකි. ඒ අනුව 2016 වර්ෂයේ රුපියල් මිලියන 05 ක වියදමක් දරමින් නිල නිවාසයක් ඉදිකෙරිණි.



**අලුතින් ඉදිවුන නිල නිවාසය**

- අබලන්ව පැවති මාර්ග පද්ධතිය කොටසක් අලුත්වැඩියා කළ අතර, ඒ තුලින් නරඹන්නන්ට පහසුවෙන් උද්‍යානය නැරඹීමට ඉඩ ප්‍රස්ථාව හිමි විය. මේ සඳහා රුපියල් මිලියන 3.3 ක ප්‍රතිපාදන වෙන් කෙරුණි.

- හක්ගල උද්භිද උද්‍යානය නුවරඑළිය නගරයේ සිට කි.මී 15 ක් පමණ දුරින් පිහිටා ඇති අතර, උද්‍යානය නැරඹීමට පැමිණෙන නරඹන්නන් හට හොඳ තත්වයේ ආහාරපාන ලබා ගැනීමට සුදුසු ස්ථානයක් උද්‍යානය පිහිටා ඇති ප්‍රදේශයේ දැනට නොමැත. මේ පිළිබඳව අවධානය යොමු කර නරඹන්නන්ට හොඳ තත්වයේ ආහාරපාන ලබා දීමේ අරමුණින් උද්‍යානය තුල කැෆටේරියා ආපනශාලාවක්ද මේ වසරේ ඉදිකෙරිණි.



කැෆටේරියා ආපනශාලා ගොඩනැගිල්ල

## ගම්පහ උද්භිද උද්‍යානය

- රුපියල් මිලියන 2.7 ක වියදමක් දරමින් බොන්සායි පැළ එකතුවක් උද්‍යානයේ ස්ථාපිත කිරීමට උද්භිද උද්‍යාන භාර අරමුදල කටයුතු කරන ලදි.



මහජන ප්‍රදර්ශනය සඳහා විවෘත කිරීමට සකසන බොන්සායි පැළ ගෘහය

- උද්‍යානය අලංකාරව පවත්වාගෙන යාම සඳහා නව මල් ප්‍රභේද, බීජ, පොහොර වැනි දෑ මිලදී ගැනීම සඳහා ද උද්භිද උද්‍යාන භාර අරමුදල මේ වසරේ ප්‍රතිපාදන වෙන් කරන ලදි.

## අවිස්සාවේල්ල තෙත් කලාපීය උද්භිද උද්‍යානය

- උද්‍යානයේ ආරක්ෂාව උදෙසා චේන්ක් ලින්ක් වැටක් සවි කිරීම මෙම වසරේ සිදු වූ අතර, ඒ සඳහා රුපියල් මිලියන 2.6 ක ප්‍රතිපාදන සලසන ලදි.

- පෙර වර්ෂවල මෙන්ම මෙම වසරේද උද්‍යානයේ අලංකරණ කටයුතු සිදු කිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමට උද්භිද උද්‍යාන භාර අරමුදල කටයුතු කරන ලදි.

## මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය

- බැටරි කාර් රථ සඳහා ඇති ඉල්ලුම ඉහළ යාම නිසාවෙන් මෙම වසරේ වියළි කලාපීය උද්භිද උද්‍යානයට නව බැටරි කාර් රථයක් මිලදී ගත් අතර, ඒ සඳහා රුපියල් මිලියන 1.8 ක් වැය විය. ඒ අනුව උද්‍යානයේ බැටරි කාර් 05 ක් සේවයේ යොදවා ඇත.



වියළි කලාපීය උද්‍යානය සඳහා මිලදී ගත්
බැටරි කාර් රථයක්

## ගනේවත්ත වන ඖෂධ උද්‍යානය

- මෙම වසරේදී උද්‍යානය සඳහා නව ගිම්හාන කුටියක් ඉදිකිරීමට කටයුතු කරන ලදි.මේ සඳහා රුපියල් මිලියන 01 ක් පමණ වැය විය.



ගනේවත්ත වන ඖෂධ උද්‍යානයේ ඉදිකල
ගිම්හාන කුටිය

- උද්‍යානයේ ඖෂධ පැළ නිෂ්පාදනය ඉහළ නැංවීම, අබලන්ව පැවති මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම , කාර්යාලය සඳහා අවශ්‍ය ලී බඩු මිලදී ගැනීම වැනි කටයුතු සඳහා මෙම වසරේදී උද්‍යාන භාර අරමුදලේ ප්‍රතිපාදන සලසන ලදි. මේ සඳහා රුපියල් මිලියන 03 ක් පමණ වැය විය.

## ජාතික ශාකාගාරය

- ශාකාගාරය මෙම වසරේ නවීකරණයට භාජනය වූ අතර, ඒ සඳහා රුපියල් මිලියන 2.4 ක් වැය විය.



නවීකරණය වූ ශාකාගාරය

## ජාතික ශාකාගාරය 2016 වර්ෂයේ ඉටු කරන ලද විශේෂිත උද්භිද විද්‍යා පර්යේෂණ කටයුතු

### ශාක එකතුව සහ එම කටයුතු කළමනාකරණය කිරීම

| Activity | No. of Specimens treated |
|---|---|
| Mounting | 987 |
| Remounting | - |
| Specimens repaired | 5285 |
| Cleaning books | 995 |
| Poisoning | _ |
| Deep Freezing | 1614 |
| Species covers added | 330 |
| Genus covers adding,labelling and repairing | 443 |
| Specimens cleaned | 28696 |
| Pressing | 1276 |
| Labels typed for genus covers, Specimens & Genus cards | 1824 |
| Preparation of tags | 2347 |

### ක්ෂේත්‍ර චාරිකාවේදී ශාක එකතුව පිළිබඳව විස්තර
### (Enrichment OF Herbarium)

| Type of collection | Field Exploration /Other source | Verified and added | No. of specimens places of specimen deposited |
|---|---|---|---|
| ***Angiosperms*** | Kurulukele | 17 | National Herbarium |
| | Hambanthota | 27 | National Herbarium |
| | Wasgamuwa | 17 | National Herbarium |
| | Galways Land | 40 | National Herbarium |
| | Chundikulam Wildlife Sanctuary, Kilinochchi district | 111 | National Herbarium |
| | Sea grasses from Maricchikattu beach-submitted | 54 | National Herbarium |
| | Hurulu Biosphere excursion | 36 | National Herbarium |

| Type of collection | Field Exploration /Other source | Verified and added | No. of specimens places of specimen deposited |
|---|---|---|---|
| | Habarana-Girithale field excursion.exploration | 39 | National Herbarium |
| | Horton Plains | 56 | National Herbarium |
| *Angiosperms* | Mulathivu | 59 | National Herbarium |
| | Other voucher specimens | 09 | National Herbarium |
| | Kaluganga-Moragahakande | 128 | National Herbarium |
| | Pidurutalaga, | 10 | National Herbarium |
| | Alagalla | 16 | National Herbarium |
| | Mannar and other locations of Jaffna | 64 | National Herbarium |
| | Gampaha | 05 | National Herbarium |
| | Ritigala | 01 | National Herbarium |
| | Namunukula | 40 | National Herbarium |
| | Knuckles conservation, Matale, Pitawalapatana | 13 | National Herbarium |
| | Ambagamuwa | 14 | National Herbarium |
| | A'Peak area | 26 | National Herbarium |
| | Aponogeton species handers over by Prof. D. Yakandawela | 28 | National Herbarium |
| | Kiribathgalla | 08 | National Herbarium |
| | Ratnapura | 03 | National Herbarium |
| | Kurunegala | 10 | National Herbarium |
| **Total** | | **831** | |
| **MOSSES** | From Various locations | **175** | National Herbarium |
| **FERNS** | From Various locations | **212** | National Herbarium |
| | **Grand Total** | **1218** | |

- **පවත්වන ලද වැඩමුළු**

  පැළෑටි හඳුනා ගැනීම, ශාකාගාර නඩත්තු හා ශාක සංරක්ෂණය පිළිබඳව වැඩමුළු 06 ක් පැවැත් වූ අතර, ඒ සඳහා 476 දෙනෙකු සහභාගි විය.

- **පහත සඳහන් කරුණු යටතේ නරඹන්නන් දැනුවත් කරන ලදී.**

| Category | No. of specimens Identified |
|---|---|
| Angiosperms | 1,812 |
| Ferns | 218 |
| Mosses | 130 |
| Number of letters , e-mails etc. answered on floristic information | 302 |

- අධිකරණ කටයුතු 33 ක් සඳහා ශාක හඳුනාගැනීම් 249 ක් සිදු කර ඇත.

- උද්භිද විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති 21 ක් සඳහා දිවයිනේ වනරක්ෂිත වල ක්ෂේත්‍ර කටයුතු නිරීක්ෂණය කරන ලදී.

- උද්භිද විද්‍යා පර්යේෂණ කටයුතුවලට අදාලව එකතු කළ දත්ත ආශ්‍රයෙන් නරඹන්නන් දැනුවත් කිරීම සඳහා පෝස්ටර්, ප්‍රකාශන ප්‍රසිද්ධ කරන ලදී.

## අධ්‍යාපන පුහුණු මධ්‍යස්ථානය

- අධ්‍යාපන පුහුණු මධ්‍යස්ථානය මගින් උද්‍යාන අලංකරණය හා මල්වගා පුහුණුව පිළිබඳව පාඨමාලා පවත්වනු ලබන අතර, ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමට උද්‍යාන භාර අරමුදල කටයුතු කර ඇත.

## මල් වගා අංශයේ සිදු වූ සංවර්ධන කාර්යයන්

- මල්වගා අංශය සඳහා අවශ්‍ය රසායනික ද්‍රව්‍ය, උපකරණ මිලදී ගැනීම ආදිය වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කෙරුණි.

- නාරාහේන්පිට දේශන ශාලාව ඉදිකිරීම සඳහා මෙම වසරේ රුපියල් මිලියන 2.6 ක් වෙන් කෙරුණි.



**නාරාහේන්පිට පිහිටි සහකාර අධ්‍යක්ෂ කාර්යාලයෙහි ස්ථාපිත කරන ලද ශ්‍රවණාගාරය**

- ලංකාව පුරා විසිර සිටින මල් වගා කරුවන්ට අත්වැලක් වෙමින් මල් වගා ප්‍රදර්ශන පැවැත්වීමට පහසුකම් සලසා දීමට මල් වගා අංශය කටයුතු කරන අතර, ඒ සඳහා අවශ්‍ය සෙවණ ගෘහයක් හා කාර්යාලයට අවශ්‍ය උපකරණ මිලදී ගැනීමටද අරමුදල කටයුතු කරන ලදි. මෙම කටයුතු සඳහා රුපියල් මිලියන 05 ක් පමණ වැය වී ඇත.

- රුපියල් මිලියන 2.9 ක පිරිවැයක් දරමින් මල් වගා අංශයේ පර්යේෂණ කටයුතු සඳහා විදුලි ධාරිතාව වැඩි කිරීමටද කටයුතු කරන ලදි.

## මල් වගා අංශයේ 2016 වර්ෂයේ සිදු කල පර්යේෂණ කටයුතු වලින් කීපයක් පහත දැක්වේ.

Philodendron erubescens cv. "Gold" ශාකයේ අග්‍රස්ථය ඉවත් කර BAP හා IAA යෙදීම මගින් පාර්ශ්වික අංකුර වර්ධනය වැඩිකිරීම සඳහා පර්යේෂණයක් සිදු කරන ලදි. 250 mg/l BAP + mg/l IAA සහ 250 mg/l BAP + 125 mg/l IAA යෙදීම මගින් ඉහළම පාර්ශ්වික අංකුර හා පත්‍ර ප්‍රමාණයක් ලබා ගත හැකි බව සොයා ගැණින.

පිච්ච (jasminum grandiflorum) පසු අස්වනු කල් තබා ගැනීම පිණිස විවිධ පසු අස්වනු තාක්ෂණ ක්‍රම වල බලපෑම සොයා බලන ලදි. පිච්ච පොහොට්ටු 10 $^0$c හෝ 13 $^0$c උෂ්ණත්වයේ පෙර ශීතනය කර බෝරික් අම්ලය 4% ද්‍රාවණයක පොගවා ගේජ් 150 හෝ 300 LDPE පොලිතින් බෑග් වල අසුරා තැබීම මගින් සුදු පැහැය හා නැවුම් පෙනුම දින 04 ක් දක්වා බර අඩුවීමකින් තොරව වායුසමීකරණ තත්ව යටතේ තබා ගත හැකි බව සොයා ගැණින.

උඩවැඩියා පටකරෝපණය සඳහා අඩු වියදම් ක්‍රමවේද යොදා ගැනීම පිළිබඳව පර්යේෂණයක් සිදු කරන ලදි. සව්, රුලන් හා කෝන්පිටි Ms හා Knc මාධ්‍ය ඝන කිරීමේ ආදේශක ලෙස යොදා ගත හැකි බව සොයා ගන්නා ලදි. වැසි ජලය හා නල ජලය ආදේශක ලෙස යොදා ගත හැකි බවද සොයා ගන්නා ලදි.

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව මගින් වැඩි දියුණු කරන ලද නව ඇන්තූරියම් ප්‍රභේද පටකරෝපණය කිරීම සඳහා නව ප්‍රශස්ථ ක්‍රමවේද හඳුනාගැනීම එක් අංකුරයකින් අංකුර 25 බැගින් වන ගුණනයක් ලබාගත හැකි කාර්යක්ෂම පටකරෝපණ ක්‍රමවේදයක් ලෙස ½ Ms මාධ්‍යයට 0.1 mg/l 2,4 D , 1.0 mg/l BAP, 720 mg/l NH4 NO3 එකතු කිරීම හා 16 h ආලෝක තත්වයක් ලබා දීම සුදුසු බව සොයාගන්නා ලදි.

වියළි කලාපය සඳහා මල් වගා කර්මාන්තයේ යෙදවීමේ හැකියාව සොයා බලන ලදි. වියළි කලාපයට මල්වගා කර්මාන්තය සුදුසු බවත් මුළු දිවයිනටම ව්‍යාප්ත කල හැකි බවත් සොයා ගන්නා ලදි.

ආලෝක තත්ව වෙනස් කිරීම මගින් විසිතුරු ශාකවල පත්‍රික ඇන්තෝසයනින් එක්රැස්වීම පිළිබඳ පර්යේෂණයක් කරන ලදි. Alternanthera spp. සහ Coleus සඳහා ඇන්තොසයනින් ඒකරාශි වීම වඩාත් වේගවත් බව සොයා ගැනිණ.

Biofilmed Biolerhuiger (BPBF) මගින් Anthurium andreanum ශාකයේ වර්ධනය හා රෝග පාලනයට සිදුවන බලපෑම සොයා බලන ලදි. අනුමත රසායනික පොහොර මාත්‍රාවෙන් අඩක් හා BPBF අනුමත මාත්‍රාවෙන් යෙදීම රෝග පාලනයට සුදුසුය.

Gebera Jasmesonii ශාකයේ මල්වල ගුණාත්මයට කැල්සියම් සාන්ද්‍රණයේ බලපෑම සොයා බලන ලදි. කැල්සියම් 0-3 යෙදීම මල් නටුව ඉහල ගුණත්වයෙන් යුතුවීම සඳහා සුදුසු බව සොයා ගැණින.

## අරමුදල යටතේ 2016 වර්ෂය තුල ඉටු කරන ලද විශේෂිත සංවර්ධන කාර්යයන් පිළිබඳ සාරාංශය

| | කාර්යය | ඇස්තමේන්තුව (රු.) | 2016 -12-31 දිනට මුළු වියදම (රු.) | ඉතිරි මුදල (රු.) |
|---|---|---|---|---|
| 1 | අරමුදලේ වියදම | 430,000.00 | 428,853.50 | **1,146.50** |
| 2 | උද්භිද උද්‍යානවල පහසුකම් වැඩි දියුණු කිරිමේ වියදම | 19,475,000.00 | 19,474,793.73 | **206.27** |
| 3 | පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ සංවර්ධන වියදම | 45,900,000.00 | 45,880,606.40 | **19,393.60** |
| 4 | හක්ගල උද්භිද උද්‍යානයේ සංවර්ධන වියදම | 32,350,000.00 | 32,347,756.24 | **2,243.76** |
| 5 | ගම්පහ උද්භිද උද්‍යානයේ සංවර්ධන වියදම | 3,170,000.00 | 3,160,542.70 | **9,457.30** |
| 6 | ගනේවත්ත වන ඖෂධ උද්‍යානයේ සංවර්ධන වියදම | 3,012,000.00 | 3,011,024.10 | **975.90** |
| 7 | ජාතික ශාකාගාරයේ සංවර්ධන වියදම | 4,715,000.00 | 4,713,947.07 | **1,052.93** |
| 8 | අධ්‍යාපන පුහුණු මධ්‍යස්ථානයේ සංවර්ධන වියදම | 915,000.00 | 913,661.76 | **1,338.24** |
| 9 | මල් වගා පුහුණු අංශයේ සංවර්ධන වියදම | 22,050,000.00 | 22,045,637.30 | **4,362.70** |
| 10 | නාරාහේන්පිට සුවහස් මල් සෙවණ ඒකකයේ සංවර්ධන වියදම | 1,290,000.00 | 1,289,899.80 | **100.20** |
| 11 | අවිස්සාවේල්ල තෙත් කලාපීය උද්භිද උද්‍යානයේ සංවර්ධන වියදම | 4,800,000.00 | 4,799,285.50 | **714.50** |
| 12 | මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානයේ සංවර්ධන වියදම | 1,893,000.00 | 1,891,687.50 | **1,312.50** |
| | **එකතුව** | **140,000,000.00** | **139,957,695.60** | **42,304.40** |

ආර්.එම්.ඩී.බී.මීගස්මුල්ල
උද්භිද උද්‍යාන භාර අරමුදලේ භාරකාර මණ්ඩලයේ සභාපති සහ
ලේකම්,
තිරසර සංවර්ධන සහ වනජීවී අමාත්‍යාංශය.

කේ.එන්. යාපා
උද්භිද උද්‍යාන භාර අරමුදලේ භාරකාර මණ්ඩලයේ
ලේකම්, සහ
අධ්‍යක්ෂ ජනරාල් ,
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව.